# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,468 - 2025 දෙසැම්බර් මස 19 වැනි සිකුරාදා - 2025.12.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 434 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 දෙසැම්බර් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.* )

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

**ගම්පහ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීම

බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය අංක 59 (01) (ආ) සහ 59 (03) වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

ගම්පහ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, වලව්වත්ත, කිඩගම්මුල්ල, ගම්පහ.

*...............පෙත්සම්කරු.*

*නඩු අංකය* : 172/2024/විශේෂ
*ස්වභාවය* : විශේෂ
*වටිනාකම* : රු. 2,615,375/=

*එදිරිව*

(1) ජයකොඩි ආරච්චිගේ දෝන දිල්හානි,
අංක 181/සී/3, යායවත්ත, බොල්ලත, ගනේමුල්ල.

(2) ජයකොඩි ආරච්චිගේ දොන් පීටර් විජේවර්ධන,
අංක 181/සී/3, යායවත්ත, බොල්ලත, ගනේමුල්ල.

(3) කාලිංග රංජනී,
අංක 181/සී/3, යායවත්ත, බොල්ලත, ගනේමුල්ල.

*............වගඋත්තරකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ මෙම අධිකරණයේ 2024.05.21 දිනැති නියෝගය ප්‍රකාරව එකී නඩුවේ 01, 02, 03 වගඋත්තරකරුවන්ගෙන් පෙත්සම්කරුට අයවීමට ඇති රුපියල් විසිහය ලක්ෂ පහළොස් දහස් තුන්සිය හැත්තෑ පහ (රු. 2,615,375/-) ක මුදල සහ එකී මුදල ගෙවා අවසන් වන තෙක් 2022.02.05 දින සිට මුල් මුදලට වාර්ෂිකව සියයට පහළවක (15%) පොළියක් ද, ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් සහ එකී මුදල් නිසියාකාරව ගෙවා නොමැති බැවින් එකී මුදල මත නීතිමය පොළිය ද, නඩු ගාස්තු ද, ඇස්කීසි ගාස්තු සහ පිස්කල් ගාස්තු ද අයකර ගැනීම සඳහා වර්ෂ 2024.09.20 දින තහනමට ගන්නා ලද එකී නඩුවේ 01 වන වගඋත්තරකාරියට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපළෙහි ඔහුට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම් ද,

**වර්ෂ 2025 ක් වූ ජනවාරි මස 13 දින ප. ව. 2.30ට,**

එකී දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්,

(i) ගැණුම් මිලෙන් සියයට විසිපහ (25%) ක් ද,
(ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියට ප්‍රකාරව නියෝජ්‍ය පිස්කල්තැනගේ ගාස්තු ද,
(iii) විකුණුම සඳහා වන සියලුම වියදම් ද, මුදලින් ගෙවිය යුතුය. තව ද, ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක් වන (75%) ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොල්ලත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බොල්ලත ගමේ පිහිටි "දෙල්ගහවත්ත" නමැති ඉඩමට එස්. බී.

ජයසේකර බ. මි. තැන විසින් වර්ෂ 1995.10.09 දින මැන සාදන ලද අංක 9486 දරන පිඹුර ප්‍රකාර ලොට් 07 දරන කොටසට මායිම් : උතුරට : මෙහිම කැබලි අංක 08 සහ 10 ද, නැගෙනහිරට : මෙහිම කැබලි අංක 06 ද, දකුණට : විල්ෆ්‍රඩ් වේරගොඩගේ ඉඩම ද, බස්නාහිරට : ඩබ්ලිව්. එස්. පෙරේරාගේ ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් එකොළහයි දශම හයයි අට (පර්. 11.68) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගසකොළ, පලතුරු ආදී සියලු දේත් වේ.

*මාර්ග අයිතිය.-*

ඉහත කී අංක 9486 දරන සැලැස්මේ පෙන්වා ඇති කැබලි අංක 10 දරන බිම් කොටසට මායිම් : උතුරට : කැබලි අංක 02, 05 සහ 04 ද, එස්. නානායක්කාර සහ තව අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : කැබලි අංක 02, 05 සහ කරුණාරත්නට අයිති ඉඩම සහ පාර ද, දකුණට: කැබලි අංක 06 සහ 07 ද, බස්නාහිරට : කැබලි අංක 09, 08, 04, 03 සහ 01 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම හතර (පර්. 12.04) ක් විශාල ඉඩම තුළ පිහිටි සියලුම ආකාරයේ වන පොදු මාර්ග අයිතිය ද සමග වේ.

තව ද, එකී ඉඩමට ප්‍රවිශ්ය වීම සඳහා එකී සැලැස්මේ පෙන්වා ඇති සියලුම මාර්ග ප්‍රවේශ අයිතීන් ද ප්‍රාදේශීය සභා පාරේ සිට ඉඩමට ප්‍රවිෂ්ය වීම සඳහා ඇති සියලුම මාර්ග අයිතීන් ද සමග වේ.

රෙජිස්ට්‍රාර් පිස්කල්,
දිසා අධිකරණය, ගම්පහ.

වර්ෂ 2025 ක් වූ සැප්තැම්බර් මස 11 දින දී ය.

12-419

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.